# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 693/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 23/04/2024 පැය 1550

**මාධ්‍ය නිවේදනය**

**අධිකරණ නියෝගයක් දැනුම් දීම.**

2024.04.24 වන දින උද්ඝෝෂණ කරුවන් පිරිසක් වැලිකඩ පොලිස් වසමේ පාර්ලිමේන්තු වට රවුම අසලදී විරෝධතාවයක් පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇති බවට වැලිකඩ පොලිස් ස්ථානාධිපතිවරයාට ලද තොරතුරක් මත ඔහු විසින් එය තහනම් කරන ලෙසට අපරාධ නඩු විධාන සංග්‍රහයේ පවතින ප්‍රතිපාදන ප්‍රකාරව කොළඹ ගරු ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයෙන් කරන ලද ඉල්ලීමට අනුව ගරු අධිකරණය මඟින් එම ඉදිරිපත් කර ඇති කරුණු සලකා බලා පහත සඳහන් වග උත්තරකරුවන් වන

1. ලංකා විදුලි සේවක සංගමයේ ලේකම් රංජන් ජයලාල් මහතා.
2. ලංකා විදුලෙි සේවක සංගමයේ ක්‍රියාකාරි සාමාජිකයින් හා වෙනත් තැනත්තන්

ඇතුළු සහභාගී වන සියළු වගඋත්තරකරුවන් හා ඔවුන්ගේ අනුගාමිකයින්ට වැලිකඩ පොලිස් වසමේ පොල්දූව වටරවුම ආශ්‍රිතව මහජනතාවට හා පදිකයින්ට අවහිර බාධා වන සේ කිසිම මාර්ගයක් හරස් කර විරෝධතා හෝ ප්‍රචන්ඩ ක්‍රියා නොකිරීමටත්, මහජන නියෝජිතයිනගේ පාර්ලිමේන්තු වරප්‍රසාදයන් උල්ලංඝනය වන අයුරින් හා රාජකාරි යෙදී සිටින රාජ්‍ය නිලධාරින්ගේ රාජකාරි සඳහා කිසිදු බාධවක් වන අයුරින් උද්ඝෝෂණ කිරීම තහනම් කරන අතර කිසිදු පුද්ගලයෙකුට අවහිරයක් නොවන අන්දමින් මෙම උද්ඝෝෂණය සිදු කිරීමට සියළු වගඋත්තරකරුවන් හා අනුගාමිකයින් වග බලාගත යුතු අතර කිසිදු අවස්ථාවක මාර්ගය අවහිර කරමින් පෙළපාලි පැවැත්වීම තහනම් කරමින් අධිකරණ ආඥාවක් නිකුත් කර ඇත.

මෙම ආඥාව කඩ කලහොත් සාමය රකිනු වස් ශ්‍රී ලංකා පොලීසිය ඊට වහාම පියවර ගත යුතු බවටත් ආඥාව මගින් දැනුම් දී ඇත.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**